විය. මෙම අවසානයේ දක්වූ කොටස තුළ එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ලද රුපියල් 9 කෝටි 30 ලක්ෂයක් සහ මහජන චීන සමූහාණ්ඩුවෙන් ලද රුපියල් 2 කෝටි 70 ලක්ෂයක ණය මුදලක් ඇතුළත් වෙයි. මෙකී මට්ටමේ විදේශාධාර නිසා සැපයුම් කරුවන්ගේ ණය හා කෙටිකාලීන ණය හේතුවෙන් වැඩිවන ණයගැති බවින් මිදීමට රටට හැකි විය. ඇත්තෙන්ම, සැපයුම්කරුවන්ගේ ණය ද ඇතුළත් (වසර අවසානයක සිට වසර අවසානයක් දක්වා) මෙරට කෙටිකාලීන ණයගැතිභාවය රුපියල් 9 කෝටි 14 ලක්ෂයකින් පහළ ගියේය.

මීට අමතරව, ගෙවුම් ශේෂ සහාය සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් සැපයුන සම්පත් ප්‍රමාණය රුපියල් 27 කෝටි 28 ලක්ෂයක් විය. අපනයන අඩුවැඩිවීම සඳහා වන්දි ලෙස මුදල් ලැබීමේ ක්‍රමය යටතේ මින් රුපියල් 15 කෝටි 80 ලක්ෂයක් ලැබුණු අතර තවත් රුපියල් 11 කෝටි 48 ලක්ෂයක් 1975 තෙල් සහන තීරණය යටතේ ශ්‍රී ලංකාවට හිමි විය යුතු අවසාන වාරිකය වශයෙන් සැපයිණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අතීත හැරගැනුම් ගිණුමෙන් ආපසු හැරගත් රුපියල් 18 කෝටි 99 ලක්ෂයක ප්‍රමාණය ඉවත් කළ පසු ගෙවුම් ශේෂ සහාය සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්පත් මගින් වූ ශුද්ධ දයකත්වය රුපියල් 8 කෝටි 67 ලක්ෂයකි.

ඉහතින් සාකච්ඡා කළ ණය ගනුදෙනු ද ඇතුළුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්පත් ප්‍රමාණය සලකා බලන විට ඒවා හිඟයට වඩා සැලකිය යුතු පරිදි වැඩිවූ අතර, එය රටෙහි විදේශ වත්කම් රුපියල් 56 කෝටි 83 ලක්ෂයකින් වැඩිකර ගැනුමට ඉවහල් විය. එමෙන්ම, එය ශ්‍රී ලංකාවට එහි වෙළෙඳ ගනුදෙනු කරුවන් සමග පවත්වාගෙන යන ද්විපාර්ශ්වික ගෙවුම්වල ණයගැතිභාවය අඩු කරලීමටද ආධාර විය. මේ හේතුවෙන් වගකීම්වල අඩුවීම රුපියල් 7 කෝටි 31 ලක්ෂයක් විය.

රජයේ මුදල් පරිහරණය

1976 දී රජය සිය මුදල් පරිහරණ කටයුතු මගින් රටේ ආර්ථික ක්‍රියාවලියට විශාල වශයෙන් සහභාගි වීමක් පෙන්නුම් කරයි. දළ ජාතික නිෂ්පාදිතයෙන් රජයේ වියදම සඳහා 1975 වර්ෂයේ දී යෙදවුන සියයට 32·8 ක ප්‍රමාණය හා සසඳන විට 1976 දී සියයට 35·9 ක් යෙදවූ අතර, එය පසුගිය වර්ෂ දහය තුළදී සියයට 31·6 ක සාමාන්‍යයක් පෙන්නුම් කරයි. මෙම වැඩි වීමට ප්‍රධාන හේතුව වූයේ රජය ඉහළ මට්ටමක ප්‍රාග්ධන වියදමක් දැරීමය. පුනරාවර්තන වියදම් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 24 ක පමණ ප්‍රමාණයකින් සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවතිණි.

ආදායම අතින් බලන විට විටින් විට වසර කිහිපයකදී හැර ආදායම සහ දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතය, පුනරාවර්තන වියදම සහ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතයට වඩා පසු බැසීමකට නැඹුරු වී ඇත. ඇත්ත වශයෙන්ම, 1973 මුදල් වර්ෂයේදී 26·6 තෙක් ඉහළ මට්ටමක පැවති ආදායම හා දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතය 1976 වර්ෂයේ දී 23·8 දක්වා පහළ වැටුණි.

1975 දී රුපියල් 14 කෝටි 20 ලක්‍ෂයක් වූ වර්තන ගිණුමේ හිඟය හා සසඳන විට, 1976 දී රුපියල් 12 කෝටි 80 ලක්‍ෂයක හිඟයක් රජයේ මුදල් පරිහරණයෙන් පෙන්නුම් කරයි. රජය සිය පුනරාවර්තන වියදම සඳහා ණයට ගත් සම්පත් යෙදවූ ප්‍රමාණය වර්තන ගිණුමේ හිඟයෙන් පිළිබිඹු කරයි.

1976 වර්ෂයේ රාජ්‍ය මුදල් කටයුතුවල සාරාංශය හා 1977 වර්ෂය සඳහා අනුමත කළ ඇස්තමේන්තු 14 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්නුම් කර ඇත. නිදන් අරමුදල් හා ණය ආපසු ගෙවීමෙන් ණය ගැනීම් වලට ඇතිවන බලපෑම් ඉවත්කොට සකස් කරන ලද රජයේ ශුද්ධ මුදල් හිඟය පරිශිෂ්ටයේ 9 වැනි සංඛ්‍යා සටහනෙහි ඉදිරිපත් කර ඇත.

14 වැනි සංඛ්‍යා සටහන

රාජ්‍ය මුදල් පරිහරණය

රුපියල් දශලක්ෂ

ශීර්ෂය	1974	1975	1976 අනුමත කළ ඇස්තමේන්තු	1976 තාවකාලික	1977 අනුමත කළ ඇස්තමේන්තු
ආදායම[1]	4,787	5,084	5,645	5,739	6,062
පුනරාවර්තන වියදම	4,506	5,153	5,355	5,554	5,888
අත්තිකාරම් ගිණුම් කටයුතු (හිඟය - / අතිරික්තය +)	− 39	− 73	− 100	− 312	—
වර්තන ගිණුම (+ අතිරික්තය / හිඟය −)	+ 242	− 142	+ 190	− 128	+ 174
ප්‍රාග්ධන වියදම	1,841	2,556	2,486	3,448	2,904
ඉන් නිදන් අරමුදල සහ ක්‍රමක්ෂය ගෙවීම්ද, ජාත්‍යන්තර සංවිධානවලට දයක දීමනා	(564)	(596)	(649)	(662)	(848)
අය වැය හිඟය[2]	1,599	2,699	2,296	3,576	2,730
හිඟය පියවීම					
1. දේශීය මූල	910	1,610	1,300	2,270	1,370
(අ) බැංකු නොවන වෙළඳ ණය	976	1,075	1,300	1,160	1,300
(ආ) වෙළෙඳපළ නොවන ණය	− 54	379	—	471	70
(ඇ) බැංකු ක්‍රමය[3]	− 12	156	—	639	—
2. විදේශ මුදල්	650	1,059	1,000	1,340	1,350
යෝජනාක්‍රම ණය	79	275	n.a.	327	n.a.
ද්‍රව්‍ය ණය	319	380	n.a.	633	n.a.
දීමනා	252	404	n.a.	380	n.a.
3. මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම	39	31	− 4	− 33	10*
රාජ්‍ය මුදල් කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම	24	184	− 4	605	10

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
සහ මහ භාණ්ඩාගාරය

1. විදේශීය දීමනා යටතේ ඇති ප්‍රාග්ධන දීමනා ආදායමෙහි ඇතුළත් කර නැත.
2. ශුද්ධ මුදල් හිඟය පිළිබඳ විස්තර සඳහා පරිශිෂ්ඨයෙහි ඇති 9 වෙනි සංඛ්‍යා සටහන බලනු මැනවි.
3. ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට දයක දීමනා ලෙස, මහ බැංකුවෙන් කෙරුන විශේෂ අත්තිකාරම් ඇතුළත්ය. 1974 දී එය රුපි. 27 ලක්ෂයකි; 1975 දී රුපි. 26 ලක්ෂයකි.

* කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරන ලද පරිදි දුම්රිය සේවා වියදම රුපියල් එක් කෝටියකින් වැඩිවීම නිසාය.

වියදම

1976 දී රුපියල් 931 කෝටි 40 ලක්ෂයක් වූ රජයේ මුළු වියදම පසුගිය වර්ෂයට වඩා සියයට 20 කට ආසන්න ප්‍රමාණයකින් වැඩිවීමක් පෙන්නුම් කරයි. 1976 වර්ෂයේ වියදම සංයුක්ත වන්නේ රුපියල් 555 කෝටි 40 ලක්ෂයක් වූ පුනරාවර්තන වියදම් ද, 31 කෝටි 20 ලක්ෂයක් වූ අත්තිකාරම් ගිණුම් යටතේ ශුද්ධ ආපසු ගෙවීම් ද, රුපියල් 278 කෝටි 60 ලක්ෂයක් වූ ප්‍රාග්ධන ගෙවීම් ද, රුපියල් 66 කෝටි 20 ලක්ෂයක් වූ නිදන් අරමුදල් දයක මුදල් ගෙවීම් හා ණය ආපසු ගෙවීම් ද වශයෙනි.

1969/70 සිට මුළු වියදමෙහි සාමාන්‍ය වාර්ෂික වැඩිවීම සියයට 20 ක් පමණ විය. 1973/75 කාල පරිච්ඡේදයේ දී පැවති ලෝක උද්ධමනකාරී තත්ත්වය සහ රජයේ ආයෝජන වැඩ පිළිවෙල 1976 දී උච්චස්ථානයකට නැගීමත්, වියදමෙහි මෙම වැඩිවීමට තුඩුදුන් ප්‍රධාන කරුණුදෙකයි.

1976 දී ඇත්ත වශයෙන්ම දරන ලද පුනරාවර්තන වියදම රුපියල් 555 කෝටි 40 ලක්ෂයක් විය. මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 7·8 ක වැඩිවීමකි. පරිපූරක වෙන්කිරීම් රුපියල් 30 කෝටි 50 ලක්ෂයක් ඇතුළු දළ වෙන්කිරීම් රුපියල් 576 කෝටි 40 ලක්ෂයක් හා සසඳන විට, ඇත්ත වශයෙන්ම දරන ලද වියදම සියයට 3·6 ක ඌණ වියදමක් පෙන්වයි.

පුනරාවර්තන වියදමෙහි සංයුතිය දැන් ක්‍රමානුකූල රටාවකට යොමු වෙමින් පවතී. මෙයින් 1976 වර්ෂයේ දී සෞඛ්‍ය, අධ්‍යාපන කටයුතු ඇතුළු සමාජ සේවා සඳහා සියයට 22 ක් ද, ආහාර සහනාධාර සඳහා සියයට 17 ක් ද, සිවිල් හා ආරක්ෂක කටයුතු පරිපාලන සඳහා සියයට 16 ක් ද වෙන්විය. රාජ්‍ය ණය සඳහා පොළී වශයෙන් සියයට 15 ක් ද, විශ්‍රාමික රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප් සඳහා සියයට 7 ක් ද යෙදවුනි. මෙහි වෙනස්වනසුළු අංශය වන්නේ ආහාර සහනාධාරය පමණි. පාරිභෝගිකයන්ට සහනයන් සමහරක් සලසා තිබියදීත් ද්‍රව්‍යවල සාපේක්ෂව පැවති අඩු මිල ගණන් නිසා, 1975 දී සියයට 23 ක් වූ ආහාර සහනාධාර 1976 දී සියයට 17 ක් දක්වා අඩු විය.

රාජ්‍ය ණය සේවාකරණ වියදම පසුගිය අවුරුදුවල සෙමෙන්, එහෙත්, ක්‍රමික වර්ධනයක් වාර්තා කර තිබේ. මෙසේ සිදුවී ඇත්තේ රජයේ අධික ණය ගැනීම් හේතුකොට ගෙනය. රජයේ ආයෝජන වලට සතුටුදයක ඵලදාවක් ලැබුනේ නම්, එය වැඩිවෙමින් පැවති ණය සේවා සඳහා හිලව් වීමට ඉඩ තිබිණ.

1976 දී (ශුද්ධ) ප්‍රාග්ධන වියදම ඊට පෙර වර්ෂයට වඩා සියයට 42 කින් වැඩිවිය. එය රුපියල් 82 කෝටි 60 ලක්ෂයක වැඩිවීමකි. නිදහස් අරමුදල් දයකත්වයන් සහ ණය ආපසු ගෙවීම් හැරුණුවිට සංවර්ධන වියදම රුපියල් 278 කෝටි 60 ලක්ෂයක් විය. රුපියල් 305 කෝටි 60 ලක්ෂයක්වූ දළ වෙන් කිරීම් හා සසඳන විට එය සියයට 9 ක ඌණ වියදමක් පෙන්වයි. එය පසුගිය වර්ෂ කිහිපය තුළ පැවති පහත්ම මට්ටම වූ අතර මෑත කාලයේ ඌණ වියදම් පිළිබඳ සාමාන්‍ය ප්‍රමාණය සියයට 20 සහ 25 අතර පැවතුණි.

පසුගිය වර්ෂ වලදී මෙන්ම ප්‍රාග්ධන වියදමින් වැඩි කොටසක් වෙන් වූයේ ආර්ථිකයේ පොදු කාර්ය සංවර්ධනය සඳහාය. වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග සඳහා රු. 55 කෝටි 30 ලක්ෂයක්ද කෘෂිකර්මය සහ ඉඩම් සඳහා රු. 18 කෝටි 80 ලක්ෂයක්ද, රාජ්‍ය පරිපාලන පළාත් පාලන සහ ස්වදේශ කටයුතු සඳහා රු. 9 කෝටියක්ද, තැපැල් හා විදුලි සංදේශ සඳහා රු. 5 කෝටි 10 ලක්ෂයක්ද, කර්මාන්ත, ධීවර, නැව් හා සංචාරක කටයුතු සඳහා රු. 60 කෝටි 80 ලක්ෂයක්ද වියදම් වී ඇත.

1976 මුදල් වර්ෂය තුළදී අත්තිකාරම් ගිණුම් යටතේ වූ ශුද්ධ ගෙවීම රු. 31 කෝටි 20 ලක්ෂයක් විය. මෙයින් වැදගත් වන්නේ, රජයේ දෙපාර්තමේන්තු සඳහා දෙන ලද අත්තිකාරම් මුදල වන රු. 16 කෝටි 30 ලක්ෂයත්, රාජ්‍ය සංස්ථාවන්ට සහ ශ්‍රී ලංකා චීන වෙළඳ ගිණුමට දළ වශයෙන් රු. 5 කෝටිය බැගින් ගෙවන ලද මුදලත්, ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගැනීම සඳහා දෙන ලද අත්තිකාරම් මුදල වූ රු. 1 කෝටි 70 ලක්ෂයත්ය. අයවැය ට පිටස්තරව ඇතිවන මෙම ගෙවීම් රජයේ වර්තන වියදමෙහි කොටසක් වන අතර, මෙය රජයේ මුදල් කටයුතු වල සමස්ත ජංගම ගිණුම් ශේෂයට අහිතකර ලෙස බලපායි.

ආදායම

1975 වර්ෂයේ ආදායමත් සමග සංසන්දනය කර බලන කල 1976 වර්ෂයේ ආදායම සියයට 13 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1976 දී මුළු ආදායම රු. 573 කෝටි 90 ලක්ෂයක් විය. ආදායම් බදු (රු. 16 කෝටි 50 ලක්ෂය), ආනයන බදු (රු. 14 කෝටිය), තේ බදු (රු. 11

කෝටි 10 ලක්ෂය) හා පිරිවැටුම් බදු (රු. 6 කෝටි 90 ලක්ෂය) සැලකිය යුතු වැඩිවීම වාර්තා කරයි. විවිධිස යටතේ වූ ශුද්ධ ලැබීම් රු. 1 කෝටි 90 ලක්ෂයකින් වැඩි වී ඇත.[1] අනෙක් අතට, අපනයන බදු (රු. 90 ලක්ෂය), දුම්කොළ බදු (රු. 80 ලක්ෂය) සහ මත් ද්‍රව්‍ය නිෂ්පාදන වලින් ලැබීම් (රු. 1 කෝටි 60 ලක්ෂය) මඳ වශයෙන් අඩුවී ඇත.

ආදයම් බදු සහ පිරිවැටුම් බදු වැඩිවීමට බොහෝදුරට හේතු වූයේ 1975/76 කාලයේ පැවති අධික මිල ගණන්ය. එම වර්‍ෂයේ වූ ආනයන මට්ටමේ වැඩිවීම ආනයන බදු වලින් පෙන්නුම් කරයි. 1975 නොවැම්බර් මාසයේ දී පොල් නිෂ්පාදනයන් සඳහා වූ අපනයන බදු අවලංගු කිරීමත් 1976 යේදී තේ අපනයනය පහත වැටීමත් අපනයන බදු අඩුවීමට හේතු විය. දුම්කොළ වෙනුවෙන් ලද ආදයම (දේශීය දුම්කොළ නිෂ්පාදනය සඳහා වූ බද්ද සහ දුම්කොළ ආනයන සඳහා වූ තීරුබදු) 1976 වර්‍ෂයේදී වර්ධනය වී ඇත.

අපනයන බදු, ආනයන තීරු ගාස්තු සහ විවිහිස ලැබීම් 1976 වසර සඳහා වූ රජයේ ආදයමින් සියයට 39 ක් වූ අතර,ආනයන අමුද්‍රව්‍ය මත විශාල වශයෙන් රඳා පවත්නා පිරිවැටුම් බදු තවත් සියයට 13 ක ප්‍රමාණයක් විය. ආර්ථිකයේ විදේශ වෙළඳ අංශය මත රජයේ ආදයම් රඳා පවත්නා අයුරු මෙයින් පැහැදිලිවම පෙනෙන අතර, බදු පදනම විවිධ අංශ වලට ව්‍යාප්ති කිරීමේ අවශ්‍යතාවයද ඉන් හඟවයි.

අයවැය හිඟය පියවීම

අත්තිකාරම් ගිණුම් යටතේ රුපියල් 31 කෝටි 20 ලක්ෂයක් වූ ශුද්ධ බැහැර ගෙවීම් සහ රුපියල් 92 කෝටි 80 ලක්ෂයක්[2] වූ අතිරේක ඇස්තමේන්තු[2] නිසා 1976 දී රුපියල් 357 කෝටි 60 ලක්ෂයක් වූ අයවැය හිඟය මූලික ඇස්තමේන්තුවට වඩා රුපියල් 128 කෝටියකින් ඉක්මවා ඇත. අමතර හිඟයෙන් කොටසක් පියවන ලද්දේ බැංකු ක්‍රමයෙන් ලබාගන්නා ලද ණය මගිනි. බැංකු ක්‍රමයෙන් ලබාගත් ණය පහසුකම් ඇතුළුව මුළු දේශීය ණය ලබා ගැනීම් ප්‍රමාණය රුපියල් 227 කෝටියක් වූ අතර, විදේශීය ණය සහ දීමනා රුපියල් 134 කෝටියක් විය.

යෝජනා ක්‍රම ණය රුපියල් 32 කෝටි 70 ලක්ෂයක් ද, ද්‍රව්‍යාධාර ණය රුපියල් 63 කෝටි 30 ලක්ෂයක් සහ දීමනා රුපියල් 38 කෝටියක් ද අයවැය පියවීම සඳහා විදේශ සම්පත් වශයෙන් ලැබී ඇත.

දේශීය අංශයෙන් බැංකු නොවන වෙළෙඳපළ ණය ගැනීම් රුපියල් 116 කෝටියක් ලැබිණ. පසුගිය වර්‍ෂවලදී මෙන්ම රජයට අනුබද්ධ වූ මාර්ගයන් (ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල සහ රක්ෂණ සංස්ථාව) දේශීය ඉතිරිකිරීම් රැස්කිරීම සඳහා මූලික වශයෙන් හේතු වී ඇත. වෙළෙඳපළ නොවන මූලයන්ගෙන් ලද කොටස රුපියල් 47 කෝටි 10 ලක්ෂයක් විය. පසුව ගෙවීමේ කොන්දේසි මත ආහාර මිලට ගැනීම් සඳහා වූ රුපියල් 21 කෝටි 40 ලක්ෂයක් ද, භාණ්ඩාගාරය වෙත වූ තැන්පතු රුපියල් 10 කෝටි 30 ලක්ෂයක්ද මෙයට ඇතුළත් විය. ඉතිරිය සපයා ගනු ලැබුවේ පරිපාලන ණය ගැනීම් සහ භාණ්ඩාගාරය වෙත වූ විවිධ අරමුදල් වලිනි.

---

1. විවිහිස ආදයම අඩු මට්ටමක පැවතීමට බොහෝ දුරට හේතු වූයේ 1976 වර්ෂයේ දී සම්ප්‍රදායික නොවන අපනයනයන්හි වඩා යහපත් ප්‍රගතියයි.

2. වඩා වැදගත් ශීර්ෂයන් වශයෙන් ඇතුළත් වන්නේ ප්‍රධාන වශයෙන් ගංගා නිම්න සහ විදුලි බල සංවර්ධනය සඳහා වූ රුපියල් 17 කෝටි 60 ලක්ෂය, නියං සහනාධාර සඳහා වූ රුපියල් 16 කෝටි 50 ලක්ෂය, නව ගුරුවරුන්ට ගෙවීම් සඳහා වූ රුපියල් 7 කෝටි 60 ලක්ෂය, විශ්‍රාම සඳහා වෙන්කළ මුදලට ප්‍රතිපූරක වූ රුපියල් 7 කෝටි 90 ලක්ෂය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ප්‍රාග්ධන දායක වීම් වූ රුපියල් 6 කෝටිය සහ දුම්රිය මැදිරි මිලදී ගැනීම සඳහා වූ රුපියල් 6 කෝටි 40 ලක්ෂයයි.

රුපියල් 63 කෝටි 90 ලක්ෂයක් වූ ඉතිරි හිඟය සඳහා මුදල් සපයන ලද්දේ බැංකු ක්‍රමය මගිනි. භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම මගින් මහ බැංකුව රුපියල් 36 කෝටි 60 ලක්ෂයක් සැපයීමෙන්ද, වාණිජ බැංකු මූලික වශයෙන්, රුපියල් සුරැකුම්පත් මිලදී ගැනීමෙන් ද ඉතිරි ශේෂය පියවීමට උපකාර විය.

රජයේ මුදල් ශේෂයේ රුපියල් 3 කෝටි 30 ලක්ෂයක වැඩිවීමක් සඳහා ගලපනු ලැබූ පසු මූල්‍ය ක්‍රියාකාරිත්වයේ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් 60 කෝටි 50 ලක්ෂයක්ව පැවතුනි.

රාජ්‍ය ණය

1976 මුදල් වර්ෂය තුළදී රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 21 කින් හෙවත් රුපියල් 309 කෝටි 50 ලක්ෂයක සිට රුපියල් 1,765 කෝටි 90 ලක්ෂය තෙක් වර්ධනය වී ඇත. රුපියල් 1,269 කෝටි 10 ලක්ෂයක දේශීය ණය වලින් සහ රුපියල් 496 කෝටි 80 ලක්ෂයක විදේශීය ණය වලින් එය සමන්විත විය. නිදන් අරමුදල් දයකත්වයන් (රුපියල් 203 කෝටි 90 ලක්ෂයක්) සඳහා ගැලපූ විට ශුද්ධ දේශීය ණය ප්‍රමාණය රුපියල් 1,065 කෝටි 30 ලක්ෂයක් විය. විදේශ ණය සඳහා නිදන් අරමුදල් දයකත්වයක් නොමැත.

1976 රුපියල් 145 කෝටි 70 ලක්ෂයක් වූ රුපියල් සුරැකුම්පත් විකිණීම් දේශීය ණයවල ප්‍රධාන කොටස විය. භාණ්ඩාගාර බිල්පත් විකිණීම් (රුපියල් 35 කෝටිය) බදු සංචිත සහතික පත්, අනෙකුත් විවිධ ලැබීම් සහ මුදල් නීති පනතේ 89 වැනි ඡේදය යටතේ මහ බැංකු අත්තිකාරම් අනෙකුත් දේශීය ණය ලැබීම් විය. පසුගිය මුදල් වර්ෂ කීපය තුළදීම මුළුමනින්ම දයක නොවූ හෝ දයකත්වය සැලකිය යුතු නොවූ රුපියල් සුරැකුම්පත් සඳහා වූ වාණිජ බැංකු දයකත්වය 1976 වසරේදී, රුපියල් 24 කෝටියක් විය. එසේම, වසර අවසානයේදී මහ බැංකුව වෙත වූ භාණ්ඩාගාර බිල්පත් වල වැඩිවීම රුපියල් 35 කෝටියක් විය. ඒ අනුව පසුගිය වසර කීපය තුළදී වූ ක්‍රමානුකූල අඩුවීම වෙනස් කරමින් බැංකු අංශය වෙත වූ දේශීය ණය ප්‍රමාණය 1975 දී වූ සියයට 29·9 සිට 1976 දී සියයට 30·6 දක්වා වැඩිවී තිබේ. 1970 දී බැංකු අංශය වෙත පැවති දේශීය ණය කොටස සියයට 45·1 ක් විය.

1976 දී විදේශීය ණය රුපියල් 126 කෝටි 30 ලක්ෂයකින් වර්ධනය විය. මෙය සියයට 34 ක වර්ධනය වීමක් පෙන්නුම් කෙරෙන අතර, පසුගිය වර්ෂයේ එම වැඩිවීම සියයට 26 ක් පමණක් විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය සඳහා යෙදවුණු දළ සම්පත් ප්‍රමාණය (රුපියල් 23 කෝටියක් වූ ණය ආපසු ගෙවීම් හැර) රුපියල් 73 කෝටියක් විය. රුපියල් 53 කෝටි 30 ලක්ෂයක් වූ ඉතිරිය ප්‍රධාන ජාත්‍යන්තර මුදල්වල විනිමය අනුපාතිකයන් වෙනස්වීම නිසා වැඩිවූ වගකීම පෙන්නුම් කෙරේ. ජාත්‍යන්තර මුදල් සඳහා වූ විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් අපගේ විදේශීය ණයගැති බව පිළිබඳ අවිනිශ්චිතතාවයකට ද තුඩු දී ඇත.

1976 දී අපනයන ඉපැයීම් වඩා හොඳවීම හේතුවෙන් 1975 සියයට 22·9 ක් ව පැවති විදේශ ණය සේවා අනුපාතය (විදේශීය ණය සේවා ගෙවීම් ප්‍රමාණය, භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස) 1976 දී සියයට 20·1 දක්වා පහත වැටීමට තුඩු දී ඇත. කෙසේ වුවද, ඉහළ ණය අනුපාතය හා දේශීය ණය පිළිබඳ පොළී බර සැලකිල්ලට භාජනය විය යුතුව ඇත. 1976 දී දේශීය ණය ආපසු ගෙවීම් සහ පොළී රුපියල් 143 කෝටි 20 ලක්ෂයක් විය; දළ ණය ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස එය සියයට 52 ක් වූ අතර, 1975 දී එය සියයට 61 ක් විය.